වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
ANNUAL REPORT
2020

වැඩිහිටි තැනැත්තන් සඳහා වන
ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய
சபை மற்றும் தேசிய செயலகம்
National Council and Secretariat for Elders

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
முதியோர்களுக்கான தேசிய சபை
National Council for Elders

සෞඛ්‍ය අමාත්‍යාංශය

சுகாதார அமைச்ச

Ministry Of Health

පටුන

පටුන.....1

පූර්විකාව.....2

විධායක වාර්තාව.....3

හැඳින්වීම.....4

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය.....5

දැක්ම.....5

මෙහෙවර.....5

සංවිධාන සැලැස්ම 2020.....6

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව 2020.....7

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වර්තාව 2020.....8

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකගේ වාර්තාව 2020.....9

2020 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය 16

ස්වයං රැකියාවල නිරත වැඩිහිටියන් සඳහා ආධාර ලබාදීම 2020.....16

වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම 2020.....17

වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන.....18

කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු 2020.....20

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය.....21

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.....23

2020 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය.....25

2020 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය.....26

2020 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.....27

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශයන්ට අදාල සටහන්.....28

විගණකාධිපතිගේ වාර්තාව.....43

විගණකාධිපතිගේ වාර්තාව සම්බන්ධ පිළිතුරු.....48

පුර්විකාව

ශ්‍රී ලාංකීක වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපුර්ණත්වය, සහභාගීත්වය හා අභිමානය සහතික කරමින් වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරලීම වෙනුවෙන්, 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමේ පනත සහ 2011 අංක 5 දරණ සංශෝධිත පනතින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව හා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත බලය පවරා ඇත.

වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය, ආත්මාභිමානය, ස්වාධීනත්වය,සහභාගීත්වය,රැකවරණය, හා ඔවුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම උදෙසා වැඩසටහන් රාශියක් වාඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාක්මක කිරීම වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ප්‍රමුඛ කාර්යභාර්ය වේ.

2020 වර්ෂයේ ශ්‍රී ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය,අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කර ගැනීමේලා ක්‍රියාත්මක වැඩිහිටි සුභසාධන වැඩසටහන්වල කාර්යය සාධනය ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කිරීම 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ අරමුණයි.

විධායක වාර්තාව

2020 වර්ෂයේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කර වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය උදෙසා කැපවී ක්‍රියා කලත් එම කාලවකවානුව තුළ රටේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් අපේක්ෂා කරන ලද අරමුණු හා ප්‍රගතිය කරා ලඟා විමට නොහැකි විය.ඒ අනුව 2020 වර්ෂයේ සැලකිය යුතු භෞතික හා මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගත හැකි විය.

වත්මන් රජයේ “සෞභාග්‍ය දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ අවුරුදු 70ට වැඩි වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් රුපියල් දෙදහසක මහජන ජීවනාධාර ලබා දීම ප්‍රධාන වූ අතර පැවති අභියෝග ජයගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ගරු අමාත්‍යතුමියගේ සහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ මඟ පෙන්වීම මෙන් ම අමාත්‍ය කාර්යය මණ්ඩලය මේ පිළිබඳව දක්වන ලද උනන්දුව ද ඉතා අගය කළ යුතුව ඇත.

එමෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලය ද, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලය ද, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්හි හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි විෂය සම්බන්ධ රාජකාරී ආවරණය කරන නිලධාරී පිරිසට ද විශේෂ ස්තූතිය හිමි විය යුතුය.

හැඳින්වීම

පසුගිය දශක කිහිපය පුරා සිදු වූ සමාජ,ආර්ථික සංවර්ධනය හේතුකොට ගෙන සෞඛ්‍යය,පෝෂණය හා අධ්‍යාපනය යනාදී අංශවල ක්‍රමික වර්ධනයක් දක්නට ඇත.එහි ප්‍රතිඵලයක් ලෙස මරණ හා උපත් අනුපාතය පහත වැටී ආපේක්ෂිත ආයු කාලය ඉහළ යාම සිදුවීමත් සමඟ මෙරට වැඩිහිටි ජනගහණයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි.ඒ අනුව වර්තමානයේ 14.6% ට ආසන්න මට්ටමේ පවතින වැඩිහිටි ජනගහණය ඉදිරි දශකය තුළ දළ වශයෙන් 21% ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

වැඩිහිටි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සුභසාධන පහසුකම් වර්ධනය කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරදීම කළ යුතුය.ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය කැපවීමෙන් ක්‍රියා කරයි.2020 වර්ෂයේදි වැඩිහිටි ප්‍රජාව සවිබලගැන්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය.ග්‍රාමීය වැඩිහිටි කමිටු,ප්‍රාදේශිය වැඩිහිටි බලමණ්ඩල හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල යනාදිය සවිබල ගැන්වීම,අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙනුවෙන් රු.2,000/-මහජන දීමනාව ගෙවීමේ කටයුතු හා අවුරුදු 100 සපිරි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රු.5,000/- මහජන දීමනාව ගෙවීමේ කටයුතු සිදුකොට ඇත.තවද ප්‍රාදේශිය චක්‍රීය ණය යෝජනා ක්‍රමය,වෛද්‍ය සායන පැවැත්වීම,අක්ෂි කාච හා ශ්‍රවණ උපකරණ ලබා දීම,වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීම,වැඩිහිටියන්ගේ සනීපාරක්ෂාව වැඩිකරලීම උදෙසා අවම පහසුකම් ලබාදීම යනාදි ව්‍යාපෘති වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල යටතේ සිදුකොට ඇත.එමෙන්ම වැඩිහිටිගේ මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා වැඩිහිටි සත්කාරකයන් පුහුණු කිරීම වැනි දෑ ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනී.

එමඟින් වැඩිහිටියන් හුදකලාවීම වළක්වා ඔවුන්ගේ සමාජ සහභාගීත්වය වර්ධනය කිරීමත්,කායික,මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය ඇති කරමින් ඔවුන්ගේ අයිතිවාසිකම් රැකදීම අපගේ අභිප්‍රාය වේ.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිතම් ආරක්ෂා කිරීමේ
පනත යටතේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.


දැක්ම

ශ්‍රී ලාංකික ජනතාවට රැකවරණය තුලින් ක්‍රියාකාරී, ජවසම්පන්න හා
ඵලදායි වැඩිහිටි දිවියක් උදාකිරීම.


මෙහෙවර

වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගීත්වය හා
අභිමානය සහතික කිරීමත්, සමාජ සංවර්ධන කාර්යයන්හි
වැඩිහිටියන්ගේ සහභාගිත්වය උනන්දු කරවීමත් හා
දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින්
වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් රැකදීමත්
අපගේ මෙහෙවර වේ.

සංවිධාන සැලැස්ම - 2020



වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2020



නම	තනතුර
1. වෛද්‍ය එස්.එච්.මුණසිංහ මහතා	සභාපති
2.ඩී.එල්.යූ.පිරිස් මහතා	උප සභාපති
3.චන්දන රණවිර ආරච්චි මහතා	ලේකම්
4. චන්දන රණවිර ආරච්චි මහතා	සාමාජික
5.මහාචාර්ය අජිත් කල්‍යාණ අමරසිංහ මහතා	සාමාජික
6.මහාචාර්ය පද්මා ගුණරත්න මහත්මිය	සාමාජික
7.මහාචාර්ය පූජ්‍ය කෝන්ගස්තැන්න ආනන්ද හිමි	සාමාජික
8.සමන්ත ලියනවඩුගේ මහතා	සාමාජික
9.ජී.වී.ඒ.ද.සිල්වා මහතා	සාමාජික
10.ටී.එම්.ජේ.සුමේධ මහතා	සාමාජික
11.ලුතිනල් කර්නල් එස්.එම්.සී.සුනිල් සිරිවර්ධන මහතා	සාමාජික
12.එන්.ටී.අමරතුංග මහත්මිය	සාමාජික
13.මහින්ද මඩිහේවා මහතා	සාමාජික
14.ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.දිසානායක මහතා	සාමාජික
15.එච්.වජිර ශ්‍රී ස්වර්ණ බංඩාර මහත්මිය	සාමාජික
16.ඒ.ඩී.ආර්.ඒ.ඩබ්ලිව්.ඥාණසිරි මහතා	සාමාජික

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වර්තාව -2020

වර්තමානය වන විට වැඩිහිටි ජනගහනය වර්ධනය වීම සමාජ ගැටලුවක් වන තරමට වර්ධනය වී ඇත.දිනෙන් දින සීඝ්‍රයෙන් වැඩිහිටි ජනගහනය ඉහළ යමින් පැවතීම අනාගතයේ ගැටළුවක් නොවීම පිණිස වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය හා රැකවරණය උදෙසා සැලසුම් සම්පාදනය කිරීමේ ප්‍රධාන වගකීම අප අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

මෙම කර්තව්‍ය ඉටු කිරීම සඳහා "2011 අංක 05 දරණ පනතින් සංශෝධිත, 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් " ලැබී ඇති බලතල අනුව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සිදු කරනු ලබයි.ඒ අනුව එම කාර්යයන් ඉටු කිරීමට පිහිටුවා ඇති ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් විවිධාකාර වැඩසටහන් රාශියක් සංවිධානය කරමින් ක්‍රියාත්මක කරන අතර,2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන "වැඩිහිටි සුභසාධනය සඳහා වන ජාතික අරමුදල" මඟින් ද වැඩිහිටි සුභසාධන සේවා වඩාත් පුළුල් අර්ථයකින් සාධනීය ප්‍රතිඵල අපේක්ෂාවෙන් දියත් කරන්නට යෙදුනි.

මෙම කාර්යභාරය ඉටු කිරීමෙහිලා ප්‍රධාන වගකීම දරණ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවත්,ජාතික වැඩිහිටි මහල්කම් කාර්යාලයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයත් කැපවීමෙන් කරන සේවය අගය කළ යුතු අතර සෙසු පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානත් තම කාලය හා ශ්‍රමය වැඩිහිටි ප්‍රජාවේ උන්නතිය වෙනුවෙන් කැපකරමින් කරනා මෙහෙවර අගය කරන අතර මාගේ කෘතඥතාව මේ සියලු දෙනා වෙත පුද කර සිටිමි.

එසේ වුවද මේ වනවිට ලංකාවේ මිලියන 3 කට අධික වැඩිහිටි ජනගහනයේ සුභසාධනය හා ආරක්ෂාව මෙවැනි ආයතනයකට සීමා කරමින් ඉටු කිරීම මහත් අභියෝගයක් මෙන් ම අසීරු කාර්යයක් වන හෙයින්,ආර්ථික ස්ථායිතාවක් සහිත පවුල මූලික කේන්ද්‍රස්ථානය වූ සමස්ත සමාජය විසින් සීඝ්‍රයෙන් ඉහළ යන වැඩිහිටි ජනගහනයේ සුභසාධනය හා ආරක්ෂාවට කැපවී වැඩිහිටියන් සඳහා සුරක්ෂිත හෙට දිනක් බිහි කිරීම වෙනුවෙන් කටයුතු කිරීමට කාලය එළඹ ඇති බව මාගේ හැඟීමයි.

වෛද්‍ය එස්.එච්.මුණසිංහ මහතා
ලේකම්

සෞඛ්‍ය අමාත්‍යාංශය

සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව - 2020

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රතිපත්තිමය තීරණය හා නිශ්චය කරන ලද ක්‍රියාමාර්ග අනුව කටයුතු කරමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් 2020 වර්ෂයේ අතකරගත් කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සැකවින් පහත දැක්වේ.මෙම වර්ෂය තුළ රටෙහි පැවති කොරෝනා (covid) වසංගතය හේතුවෙන් සැලකිය යුතු කාර්ය සාධනයක් අත්කර ගතහැකි විය.

ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනා

- **වයස අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා වූ රු2,000/- දීමනාව**

අභිමානවත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ඔවුන් හට ගරුබුහුමනින් ඒ සඳහා අත්වැලක් සැපයීම හා වැඩිහිටි සුභසාධන වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් වයස අවුරුදු 70 ඉක්ම වූ වැඩිහිටියන් වෙනුවෙන් මාසිකව රුපියල් 2,000/-ක දීමනාවක් ගෙවීම වෙනුවෙන් 2020 වර්ෂය සඳහා රු.මි. 10,000ක ප්‍රතිපාදනයන්ගෙන් ප්‍රතිලාභී පුරවැසියන් 416,667කට ප්‍රතිලාභ ලබා දෙමින් රු.මි 9.868 ක මූල්‍ය ප්‍රගතියක් වර්ෂය තුළ ලබා ඇත.

- **වයස අවුරුදු 100ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා වූ රු 5,000/- දීමනාව**

වයස අවුරුදු 100 ඉක්ම වූ වැඩිහිටියන් රටක ඉතා වැදගත් කණ්ඩායමක් සේ සැලකිය හැකිය. අවුරුදු 100 ඉක්වූ වැඩිහිටියන් රටක සංවර්ධනය පිළඹිබු කරන, විශේෂයෙන්ම සෞඛ්‍ය සම්පන්න ජාතියක් සිටින රටක් ලෙස තහවුරු කිරීම සඳහා වන මිණුම් දණ්ඩක් ලෙසට සැලකිය හැකි අතර, එක් අතකින් එය රටක ජාතික අභිමානයට ද හේතු වන කරුණක් සේ සැලකිය හැකිය. ඒ අනුව වයස අවුරුදු 100 ඉක්ම වූ සියළුම වැඩිහිටියන් වෙනුවෙන් මාසිකව රුපියල් 5,000/-ක දීමනාවක් ගෙවීම වෙනුවෙන් 2020 වර්ෂය තුළ රු.මි. 24 ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර ප්‍රතිලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 400කට දීමනාව ලබා දෙමින් රු.මි. 20ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත.

භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක වැඩිහිටි සුභසාධන වැඩසටහන්

01. ග්‍රාමීය කමිටු සවි බලගැන්වීම

පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව සියලුම ග්‍රාම නිළධාරී කොට්ඨාශවල, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල, දිස්ත්‍රික්වල සහ පළාත් සභා සීමාවල පිහිටුවා ඇති වැඩිහිටි කමිටු සඳහා මූල්‍ය අනුග්‍රහය දක්වමින් ඔවුන්ව අධීක්ෂණය කිරීම මෙමඟින් සිදුවේ.මේ සඳහා 2020 වර්ෂය තුල රු.මි. 0.930 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර 2020.12.31 දිනට රු.මි 0.928 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

02. පුහුණු පර්යේෂණ හා දැනුවත් කිරීම.

"ළමා ලෝකයයි - වැඩිහිටි වියයි" වැඩිහිටියන් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන.මේ හරහා දරුවන් හා වැඩිහිටියන් අතර අන්තර් පුද්ගල සබඳතා වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ 2020 වර්ෂය තුළ පාසල් සිසුන් 300 ක් සඳහා වැඩසටහන් 2ක් පමණක් වර්ෂය තුළ පවත්වා ඇත.

03. වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.

රජයේ විධිවිධාන වලට අනුකූලව සකස් කරන ලද ඉහළ ප්‍රමිතියකින් හා ගුණාත්මකභාවයකින් යුක්ත වූ හැඳුනුම්පතක් ජ්යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් ලබා දීම මේ මඟින් සිදු වේ. මේ සඳහා 2020 වර්ෂය තුළ රු.මි 1.654 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර වර්ෂය තුළ නව හැඳුනුම්පත් 62279 ක් නිකුත් කරමින් රු.මි 1.606 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

04. වැඩිහිටියන්ට වඩා හොඳ පහසුකම් සැපයීම සඳහා වැඩිහිටි නිවාස නඩත්තු කිරීම, ආධාර සැපයීම හා වැඩිහිටි නිවාස පරීක්ෂාව.

දිවයින පුරා පිහිටා ඇති 306 ක් පමණ වූ වැඩිහිටි නිවාසයන්හී රැකවරණය ලබන වැඩිහිටියන්ගේ තම සැඳෑ සමය ඉතා අර්ථවත්ව, සතුටින් සහ ආරක්ෂකාරීව ගතකිරීමට හැකිවෙනු වස් තම සේවාදායකයන් හට ගුණාත්මක, කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් සැපයීමට හැකිවන පරිදි දිවයිනේ සෑම වැඩිහිටි නිවාසයකම තත්වය උසස් කිරීම උදෙසා කරනු ලබන කුඩා පරිමාණයේ(පිරිවැය) අත්‍යාවශ්‍ය ඉල්ලීම් පදනම් කරගනිමින් එහි අලුත් වැඩියාවන්, උපකරණ ලබාදීම් සහ වෙනත් අත්‍යවශ්‍යතා සඳහා ආධාර උපකාර කිරීම මෙමඟින් සිදුකෙරේ.

එමෙන්ම ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන රජයේ හා පෞද්ගලික අංශයෙහි වැඩිහිටි නිවාස වල තත්වය, පවතින අක්‍රමිකතාවයන් ,නේවාසික වැඩිහිටියන්ට සපයන සේවාවන්, පිළිබඳව නිරතුරුව අධීක්ෂණය හා පරීක්ෂා කිරීම තුලින් නේවාසික වැඩිහිටියන්ට යහපත් හා ඵලදායී සේවාවක් සැලසීම මෙහි අරමුණයි. තවද ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් පාලනය වන කතරගම රජයේ වැඩිහිටි නිවාසය සහ මාලිගාතැන්න ඒච්ජින් නෝනා වැඩිහිටි නිවාසයේ පරිපාලන වියදම්, පුනරාවර්ථන වියදම් සහ අත්‍යාවශ්‍ය නඩත්තු වියදම් දැරීම මෙමඟින් සිදුකෙරේ.මේ සඳහා 2020 වර්ෂය වෙනුවෙන් රු.මි.2.413 ප්‍රතිපාදන වෙන් කොට රු.මි. 2.187ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

05.ප්‍රකාශන.

වැඩිහිටි දිනයට සමගාමීව ප්‍රචාරණ කටයුතු සිදු කිරීම,පුවත්පත් දැන්වීම් පළ කිරීම හා වර්ෂයේ වාර්ෂික වාර්තාව පළ කිරීම යනාදී මාධ්‍ය හා ප්‍රකාශන කටයුතු වෙනුවෙන් මෙම වර්ෂය තුළ රු.මි. 1.2 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර 2020 වර්ෂය සඳහා රු.මි. 1.182ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

06.ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

මේ යටතේ දිස්ත්‍රික් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලවාර රැස්වීම් 02, ප්‍රාදේශීය වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලවාර රැස්වීම් 01ක් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් - 04 ක් පවත්වා ඇත. 2020 වර්ෂයේ වෙන්වී ඇති රු.මි. 0.6 න් රු.මි. 0.596ක මූල්‍ය ප්‍රගතියතක් අත් කරගෙන ඇත.

07.වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව.

2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව පිහිටුවා ඇත. 2020 වර්ෂය තුළ සභාවාර 05ක් පවත්වා ඇති අතර මේ සඳහා වර්ෂය තුළ රු.මි. 1.0ක වෙන් වූ ප්‍රතිපාදනයන්ගෙන් රු.මි. 0.795 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

08.වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය.

2011 අංක 5 දරණ පනතින් සංශෝධිත 2000 අංක 9 දරණ වැඩිහිටි තැනැත්තන් ආරක්ෂා කිරීමේ පනතේ 24 වගන්තිය මඟින් ස්ථාපනය කර ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය සාමාජිකයින් 5 සැදුම් ලත් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන අධිකරණමය බලය සහිත ආයතනයක් වේ.එහි සභාපතිත්වය විශ්‍රාමික මහාධිකරන විනිසුරුවරයෙකු විසින් දරනු ලබයි. වර්ෂය තුළ මණ්ඩලය රැස්වීම් වාර 24ක් පවත්වා ඇත.මේ සඳහා රු.මි. 1.27 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර රු.මි. 1.247ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

09.රු.2,000/- වැඩිහිටි දීමනාව සම්බන්ධව පරිපාලන වියදම් .

වයස අවුරුදු 70 ඉක්ම වූ අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙත ලබා දෙන වැඩිහිටි දීමනාවට අදාලව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ රාජකාරී කටයුතු වෙනුවෙන් අවශ්‍ය ලිපි ද්‍රව්‍ය දීමනා සහ වැඩිහිටි දීමනාවට අදාල සහතිකපත්, ලෙජර් මුද්‍රණය වෙනුවෙන් මුදල් ලබා දීම මේ යටතේ සිදු කරන ලදී.ඒ අනුව 2020 වර්ෂය සඳහා රු.මි.4.10 ක ප්‍රතිපාදන වෙන් කර ඉන් රු.මි. 3.90ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

10.වෙනත් වියදම්.

වැඩිහිටි සුභසාධන වැඩසටහන් වලට සමගාමීව සිදුවන විවිධ වැඩසටහන් හා රාජ්‍ය මට්ටමින් සිදුකරනු ලැබූ විවිධ ව්‍යාපෘතිවල සංවිධාන කටයුතු මේ හරහා සිදු කරනු ලැබීය. (උදා ,එන්ට්‍රප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසහන,රට වෙනුවෙන් එකට සිටිමු වැඩසටහන) මේ සඳහා 2020 වර්ෂය සඳහා රු.මි.0.1 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ඉන් රු.මි.0.052 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

11.වැඩිහිටි ස්වයං රැකියා ආධාර ලබා දීම.

ස්වයං නිර්මාණශීලි හැකියාවන් හා අත්දැකීම් පදනම් කරගනිමින් වැඩිහිටි පුරවැසියන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. වයස අවුරුදු 60ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා රු. 30,000/ ක උපරිමයකට යටත්ව ස්වයං රැකියා ආධාර ලබා දීම සිදු කරනු ලැබීය. ඒ අනුව 2020 වර්ෂයේ රු.මි.11.950 ක වෙන් වූ ප්‍රතිපාදනයන්ගෙන් වැඩිහිටි ස්වයං රැකියාලාභීන් 322 දෙනෙකු වෙත මූල්‍ය අනුග්‍රහකත්වය ලබා දෙමින් රු.මි.11.829ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

12.ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම.

"වසංගත හමුවේ වැඩිහිටි අභියෝග" යන තේමාව යටතේ 2020 වර්ෂයේ වැඩිහිටි දින සැමරුම "කොළඹ පදනම්" ආයතනයේදී වැඩිහිටියන් 350ක් පමණ පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්වීය.මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම, අවුරුදු 75 ට වැඩි වැඩිම දරුවන් ප්‍රමාණයක් සිටින දෙමාපියන් පිදීම හා සියක් ආයු සපිරි මව, පියා පිදීම,ජේෂ්ඨ හරසර ක්‍රීඩා අනුග්‍රහක වැඩසටහන ඇතුළුව ජාතික උත්සවය වෙනුවෙන් රු.මි. 2.39ක මුදලක් වෙන් වූ අතර සමස්ථයක් ලෙස රු.මි.2.320ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

13.පිළිකා ආධාර වැඩසටහන.

මහරගම අපේක්ෂා රෝහලේ නේවාසික ප්‍රතිකාර ලබන වයස අවුරුදු 60ට වැඩි රෝගී වැඩිහිටියන් වෙනුවෙන් වියළි ආහාර ලබා දීමේ වැඩසටහන් 01 ක් මේ යටතේ පවත්වන ලදී. 2020 වර්ෂයේ මේ සඳහා රු.මි. 0.444 ක ප්‍රතිපාදනයක් වෙන් වූ අතර ඉන් රු.මි.0.442 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

14.විගණන හා කළමනාකරණ කමිටු.

2020 වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පවත්වා ඇති අතර මේ සඳහා අනුමත රු.මි. 0.065 ක ප්‍රතිපාදනයන්ගෙන් රු.මි. 0.064ක මූල්‍ය වියදමක් වාර්තා කොට ඇත.

<u>සමාජ ආරක්ෂණ අරමුදල මඟින් ක්‍රියාත්මක වැඩිහිටි සුභසාධන වැඩසටහන්.</u>

01. වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීම,ලියාපදිංචි කිරීම සහ දැනට පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාසයන්ගේ නව ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් වෙනුවෙන් සිදු කර ඇති ඉල්ලීම් අනුව ප්‍රතිපාදන ලබා දීම.

සෑම වැඩිහිටි නිවාසයක්ම ශ්‍රී ලංකා ප්‍රමිති 1506:2015 / වැඩිහිටි උවටැන් නිවාස සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිතිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට අනුකූල වන පරිද්දෙන් ප්‍රමිතිගත කිරීම හා ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යන වැඩිහිටි නිවාස 50 ක් වෙනුවෙන් නිවාස අළුත්වැඩියාව හා උපකරණ ලබා දීම වෙනුවෙන් රු.මිලි.02 ක මුදලක් ලබාදීම සඳහා සැලසුම් කර ඇත.

මෙහි දී එක් වැඩිහිටි නිවාසයක් වෙනුවෙන් රුපියල් මිලියන දෙකක උපරිමයකට යටත්ව අරමුදල් ලබාදීම සිදුකරයි. ඉහත ප්‍රමිතියට අදාලව සෑම වැඩිහිටි නිවාසයක් ම ඉදිරියට පවත්වාගෙන යාම වෙනුවෙන් අවශ්‍ය භෞතික සම්පත් ගොඩනැගීම සඳහා මෙම මුදල් යොමු කෙරේ. ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා අදාල බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීමට අදාලව ඉල්ලුම්පත් කැඳවන අතර ඊට අදාල සුදුසුකම් සහ කොන්දේසි සපුරා ඇති තොරාගත් වැඩිහිටි නිවාස වෙනුවෙන් මුදල් ලබා දීම (මුදල් ලබාදීමේ කොන්දේසි ඇතුළත්ව) සිදුකරනු ලබයි. මේ සඳහා 2020 වර්ෂය තුළ රු.මි. 100 ක් වෙන් වූ අතර වර්ෂය තුළ රු.මි. 4.00 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

වැඩිහිටි නිවාස මූලික කරගනිමින් සෞඛ්‍ය පාදක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

වැඩිහිටි නිවාසවල නේවාසික වැඩිහිටියන් උදෙසා සෞඛ්‍යමය ව්‍යායාම වැඩසටහන්, නිවැරදි ආහාර රටාවන් පිළිබඳව දැනුවත් කිරීම්, උපදේශනාත්මක වැඩසටහන් හා ආගමික සහ ආධ්‍යාත්මික වැඩසහන් දිස්ත්‍රික් මට්ටමින් තෝරාගත් වැඩිහිටි නිවාස 61 ක් වෙත රු.15,000/ ක උපරිමයකට යටත්ව අරමුදල් ලබා දීම සිදුකරනු ලැබීය.මේ සඳහා 2020 වර්ෂය සඳහා රු.මි. 1.00ක් වෙන් වී ඇති අතර වර්ෂය තුළ රු.මි. 0.907 මූල්‍ය ප්‍රගතික් අත්කරගෙන ඇත.

02. අක්ෂි කාච හා ශ්‍රවණ උපකරණ ලබා දීම.

අක්ෂි හා ශ්‍රවණ ආබාධයන්ගෙන් පෙළෙන වැඩිහිටියන් උදෙසා අක්ෂි කාච හා ශ්‍රවණ උපකරණ ලබා දීම මෙහිදී සිදුකරන ලදී. මේ සඳහා වර්ෂය තුළ රු.මි. 15.50 වෙන් කර ඇති අතර ඉන් රු.මි. 0.190 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.මෙම වර්ෂය තුළ ශ්‍රවණ උපකරණ 295 ක් ලබා දී ඇත.

03. වෛද්‍ය සායන පැවැත්වීම.

මෙම වර්ෂය තුළ වෛද්‍ය කඳවුරු කෑගල්ල, රත්නපුර, හම්බන්තොට, මොණරාගල යන දිස්ත්‍රික් ආවරණය වන පරිදි මෙම වැඩසටහන පැවැත්වූ අතර,ඒ අනුව 2020 වර්ෂය සඳහා රු.මි. 66.20 ක ප්‍රතිපාදන වෙන් වූ අතර රු.මි. 0.898 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වී ඇත.

04. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර ලබා දීම.

වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය උපකරණ (මේස,කබඩ් ඇතුළු අනෙකුත්), අළුත් වැඩියා කටයුතු හා නව ඉදිකිරීම් සඳහා (උපරිම රු.මි. 2.5කට යටත්ව) ඉල්ලීම් අනුව ආධාර ලබා දීම මෙහිදී සිදුකරනු ලැබීය.මේ සඳහා වර්ෂය තුළ රු.මි. 175.00 ක ප්‍රතිපාදන වෙන් කළ අතර නව දිවා මධ්‍යස්ථාන 26 ක් ඉදිකිරීම සහ එක් දිවා මධ්‍යස්ථානයක් සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීමට ආධාර ලබාදෙමින් රු.මි 57.56 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

05. ප්‍රාදේශිය චක්‍රීය ණය යෝජනා ක්‍රමය.

සක්‍රීය වැඩිහිටි වියක් උදෙසා වැඩිහිටියන් පෙලගැස්වීමත්,ආර්ථික ශක්තියක් සහිත පුද්ගලයන් බවට පත් කිරීම තුළින් ඔවුනට ආර්ථික,සමාජීය,දේශපාලනික, හා සංස්කෘතික සන්දර්භය තුල ආත්ම අභිමානයක් සහිතව ජීවත් වීමට අවශ්‍ය පරිසරයක් නිර්මාණය කිරීම යන අරමුණ පෙරදැරිව ප්‍රාදේශිය චක්‍රීය ණය යෝජනා ක්‍රමය ප්‍රාදේශිය බලමණ්ඩල යොදා ගනිමින් ණය අරමුදල් ක්‍රමවේදයක් ගොඩනැඟීම මෙහිදී සිදු වේ.මේ සඳහා 2020 වර්ෂය සඳහා රු.මි. 1.00 ක ප්‍රතිපාදන වෙන් කළ අතර මූලික සංවිධාන කටයුතු පමණක් සිදු කර ඇත.

06. ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබල ගැන්වීම.

ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබලගැන්වීම යටතේ වැඩිහිටි කමිටු ශක්තිමත් කිරීම වෙනුවෙන් ඒ සඳහා අවශ්‍ය උපකරණ හා අවශ්‍ය භාණ්ඩ ආදිය ලබා ගැනීම වෙනුවෙන් ග්‍රාමීය කමිටු වෙත (රුපියල් ලක්ෂයක උපරිමයකට යටත්ව) මූල්‍ය අනුග්‍රහය ලබා දීම මේ යටතේ සිදුවේ.ඒ අනුව 2020 වර්ෂයේ කමිටු 135 ක් වෙත අවශ්‍ය උපකරණ ලබා ගැනීම සඳහා අරමුදල් ලබා දී ඇත.2020 වර්ෂය සඳහා මේ වෙනුවෙන් රු.මි. 20.00 ක් වෙන් වී ඇති අතර රු.මි. 13.25 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වී ඇත.

07. වැඩිහිටියන් තම නිවස තුල ජීවත් වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීම.

වයස අවුරුදු 60ට වැඩි වැඩිහිටියන් වෙනුවෙන් ජීවත්වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් හා සනීපාරක්ෂක ද්‍රව්‍ය (කොමඩ්,ඇඳ,මෙට්ට,අත්වැට,හා නිවසේ අළුත් වැඩියාවන්) සැපයීම වෙනුවෙන් ඉල්ලීම් අනුව එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙනුවෙන් රු.මි. 0.3 ක උපරිමයකට යටත්ව ප්‍රාදේශී ලේකම් කාර්යාල 230 ක පුද්ගලයින් 1800 කට ආසන්න පිරිසකට අරමුදල් ලබා දීම සිදුකර ඇත.2020 වර්ෂය වෙනුවෙන් රු.මි. 99.30 ක වෙන්වී ඇති ප්‍රතිපාදනයන්ගෙන් රු.මි 53.011 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වී ඇත.

08. දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

දිස්ත්‍රික් මට්ටමින් වැඩිහිටි විෂය ආවරණය කරනු ලබන නිළධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම වෙනුවෙන් වර්ෂයකට එක් වරක් ඉල්ලීම් අනුව රු.50,000/ බැගින් ලබා දේ.2020 වර්ෂය සඳහා මාස 06 ක් සඳහා රු.25,000/- බැගින් දිස්ත්‍රික් 25ක් වෙත අරමුදල් ලබා දී ඇති අතර ප්‍රගති සමාලෝචන රැස්වීම වාර 15 ක් පවත්වා ඇත .මේ සඳහා වර්ෂය තුළ රු.මි. 1.25ක ප්‍රතිපාදන වෙන් කර රු.මි. 0.789 මූල්‍ය ප්‍රගතියක් වාර්තා වී ඇත.

09. පරිපාලන වියදම්.

සමාජ ආරක්ෂණ අරමුදල මඟින් ක්‍රියාත්මක වැඩිහිටි සුභසාධන වැඩසටහන් සඳහා වූ පරිපාලනමය වියදම් මෙමඟින් දරා ඇත.මේ සඳහා 2020 වර්ෂය වෙනුවෙන් රු.මි. 5.00 ක් වෙන් වූ අතර රු.මි.1.200 ක් වියදමක් මෙමඟින් දරා ඇත.

10. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සැකසූ ව්‍යාපෘති.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වන ගෙවතු වගා,රසකැවිලි නිෂ්පාදන,ගොක්කොළ ආශ්‍රිත සැරසිලි කලාව,කොච්චි වගාව,විසිතුරු මල් වගාව,කෘෂිකාර්මික බීජ පැළ හා පැළ ලබා දීම,සංගීත භාණ්ඩ බෙදාදීමේ වැඩසටහන් ආදී ව්‍යාපෘති වෙනුවෙන් 2020 වර්ෂය සඳහා රු.මි. 1.00ක ප්‍රතිපාදන වෙන් කළ අතර මූල්‍ය ප්‍රගතියක් වර්තා වුයේ නැත.

11. පන්නල වෙල්කම් වැඩිහිටි නිවාසය නඩත්තු කටයුතු.

පන්නල වෙල්කම් විලේජ් වැඩිහිටි නිවාසයේ දෛනික කටයුතු සහ සෙසු කටයුතු වෙනුවෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් 2020 වර්ෂය සඳහා රු.මි. 27.50ක ප්‍රතිපාදන වෙන් කළ අතර රු.මි. 6.106ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

12. වැඩිහිටි චාරිකා සංවිධානය.

වැඩිහිටි සංවිධාන සඳහා වාර්ෂිකව ආගමික වන්දනා චාරිකා වෙනුවෙන් රු.50,000/ ක උපරිමයකට යටත්ව වැඩිහිටි චාරිකා 18ක් සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත.2020 වර්ෂය වෙනුවෙන් මේ සඳහා රු.මි. 2.50ක් වෙන් කළ අතර රු.මි. 0.894 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වී ඇත.

13. කතරගම නව වැඩිහිටි නිවාසය ඉදිකිරීම.

කතරගම නව වැඩිහිටි නිවාසයේ ඉදිකිරීම සඳහා වූ මූලික අදියරේ කටයුතු සඳහා වර්ෂය තුළ රු.මි. 0.0515 ක මූල්‍ය වියදමක් දරා ඇත.කතරගම වැඩිහිටි නිවාසය ඉදි කිරිම,තංගල්ල යායවත්ත අන්තර් රැදවුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම,කොළඹ අන්තර් රැදවුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම වෙනුවෙන් 2020 වර්ෂයේ රු.මි.550.00 ක් වෙන් කරන ලදී.

15. "සුරැකුම" ස්වයං රැකියා යෝජනා ක්‍රමය.

මේ යටතේ වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ආශ්‍රිත ආදායම් උත්පාදන වැඩසටහන් දිරි ගැන්වීම සිදු කෙරේ.තනි පුද්ගල හෝ කණ්ඩායම් සඳහා ස්වයං රැකියාවක් සිදු කරගෙන යෑම සඳහා උපරිම රු.50,000/- කට යටත්ව මුල්‍යාධාර ලබාදීම සිදු කරයි.ඒ අනුව 2020 වර්ෂය සඳහා රු.මි.3.00 වෙන් වූ අතර මුල්‍ය ප්‍රගතියක් ළඟාකර ගැනීමට නොහැකි විය.

16.ආරෝග්‍යා සෞඛ්‍ය වැඩසටහන.

2020 වර්ෂයේ ආරම්භ වූ මෙම වැඩසටහන යටතේ පිළිකා,වකුගඩු,අංශභාගය යනාදී රෝග සඳහා එක් අයෙකුට එක් වතාවක් පමණක් ලබාදෙන රුපියල් 25,000 ක මුල්‍ය ආධාරයක් ලබාදෙනු ලබයි.වයස අවුරුදු 60 සම්පූර්ණ වී තිබීම අනිවාර්ය වන අතර වෛද්‍ය පරීක්ෂණ ,ඖෂධ මිලදී ගැනීම ,ප්‍රවාහන පහසුකම් සැපයීම යනාදිය සඳහා මෙම ආධාරය පිරිනමනු ලබයි.2020 වර්ෂයේ දී පුද්ගලයන් 186 දෙනෙකුට ආධාර ලබා දෙමින් රු.මි. 4.975 ක මුල්‍ය ප්‍රගතියක් ලබාගත් අතර මේ සඳහා රු.මි. 4.95 ක මුදලක් වෙන් විය.

චන්දන රණවීර ආරච්චි
සමාජ සේවා අධ්‍යක්ෂ
(වැ.බ) ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2020- වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය.

ස්වයං රැකියාවල නිරත වැඩිහිටියන් සඳහා ආධාර ලබා දීම - 2020

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ගණන
බස්නාහිර	කළුතර	11
	කොළඹ	05
	ගම්පහ	13
මධ්‍යම	මාතලේ	08
	මහනුවර	08
	නුවරඑළිය	01
දකුණ	ගාල්ල	10
	මාතර	10
	හම්බන්තොට	06
නැගෙනහිර	මඩකලපුව	20
	අම්පාර	19
	ත්‍රිකුණාමලය	04
වයඹ	කුරුණෑගල	40
	පුත්තලම	13
උතුරු මැද	අනුරාධපුරය	11
	පොළොන්නරුව	03
ඌව	බදුල්ල	09
	මොණරාගල	31
සබරගමුව	රත්නපුර	20
	කෑගල්ල	47
උතුර	මන්නාරම	-
	මුලතිව්	09
	වවුනියාව	02
	යාපනය	18
	කිලිනොච්චි	04
එකතුව		**322**

වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම - 2020

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ගණන
බස්නාහිර	කළුතර	3215
	කොළඹ	5234
	ගම්පහ	6100
මධ්‍යම	මාතලේ	850
	මහනුවර	4241
	නුවරඑළිය	2025
දකුණ	ගාල්ල	4562
	මාතර	3189
	හම්බන්තොට	1774
නැගෙනහිර	මඩකලපුව	2155
	අම්පාර	2345
	ත්‍රිකුණාමලය	1201
වයඹ	කුරුණෑගල	4318
	පුත්තලම	2400
උතුරු මැද	අනුරාධපුරය	1982
	පොළොන්නරුව	1454
ඌව	බදුල්ල	739
	මොණරාගල	1028
සබරගමුව	රත්නපුර	2672
	කෑගල්ල	5386
උතුර	මන්නාරම	377
	මුලතිව්	215
	වවුනියාව	578
	යාපනය	1202
	කිලිනොච්චි	303
එකතුව		**59545**
ප්‍රධාන කාර්යාලයෙන් ජංගම සේවාවලදි නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව		2734
නිකුත් කළ මුළු හැඳුනුම්පත් ගණන		**62279**

වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ යෝජනාවක් පරිදි ඉතාමත් අසරණ දිළිඳු තත්වයේ පසුවන අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන්ට පිළිසරණක් වීම අරමුණු කොට ගෙන මෙම වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත.

මෙම වැඩසටහන සඳහා ඕනෑම අයෙකුට මුදල් පරිත්‍යාග කළ හැකි වන අතර,එසේ පරිත්‍යාගශීලීන් විසින් ලබා දෙන මුදල් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගන්නා ලද ඉතාමත් දිළිඳු අසරණ වැඩිහිටියන් වෙනුවෙන් මසකට රුපියල් 250/- ක මුදලක් හෝ මසකට රුපියල් 500 /- බැගින් මුදල් ආධාර ලබාදීමට කටයුතු කර තිබේ.ප්‍රතිලාභීන් සඳහා මුදල් ලබාදීමේ දී මාස 4 කට වරක් එක් ප්‍රතිලාභියෙකු සඳහා රු.1,000/- ක මුදලක් හෝ රු. 2000/- බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදල් ලබාදීම සිදු කරන අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ප්‍රතිලාභියා වෙත මුදල් ලබා දීම සිදු කරනු ඇත.

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිටින අපගේ නිලධාරියෙකු (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/සමාජ සේවා නිලධාරී/සංවර්ධන නිලධාරී) සෑම තුන් මසකට වරක් මෙම ප්‍රතිලාභීන් පිළිබඳව තොරතුරු සොයා බලනු ලබන අතර ප්‍රතිලාභීන්ට මුදල් ලබා දෙන සෑම අවස්ථාවකම පරිත්‍යාගශීලීන්ව දැනුවත් කරනු ලබයි.

එසේම මෙම වැඩසටහන යටතේ ආධාර ලබාදීමේදී තමන් කැමති අයෙකු හෝ කීප දෙනෙකු තෝරා ගැනීමට හෝ තමන් කැමති ප්‍රදේශයක අයෙකු හෝ කිහිප දෙනෙකු නම් කිරීමට පරිත්‍යාගශීලියාට ද හැකියාව ඇත.එසේ නොමැති නම් එම තෝරාගැනීම මෙම කාර්යාලය මඟින් සිදුකරනු ලබන අතර,ප්‍රතිලාභියාගේ නම,ලිපිනය ඇතුලත් තොරතුරු පරිත්‍යාගශීලියා වෙත ලබාදීමට අප කාර්යාලයෙන් කටයුතු කරනු ඇත.

මෙම වැඩසටහන සඳහා දායකත්වය ලබාදිමට කැමති අයකු වේ නම් බත්තරමුල්ල ලංකා බැංකුවේ අංක 228075 දරණ “වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය සඳහා වන ජාතික අරමුදල” යන ගිණුමට ඔබගේ පරිත්‍යාග මුදල් ලබාදිය හැකි අතර,එසේ මුදල් තැන්පත් කිරීමේදි මුදල් තැන්පත් කළ ලදුපතේ පිටපතක් අප වෙත ලබාදිය යුතුය.එසේත් නොමැති නම්,අප කාර්යාලයට පැමිණ ඔබගේ මුදල් පරිත්‍යාග ලබාදිය හැක.

මෙය අසරණ වැඩිහිටියන් වෙනුවෙන් සිදුකරනු ලබන මහඟු පුණ්‍ය කටයුත්තක් වන බැවින් එය තවදුරටත් ව්‍යාප්ත කරමින් වැඩිහිටියන් විශාල පිරිසකට මෙම වැඩසටහනින් සේවයක් සැලසීමට අදහස් කර තිබේ.

ඒ අනුව 2020 වර්ෂයේදී වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහනේ පරිත්‍යාගශීලීන්,ප්‍රතිලාභීන් හා අදාල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ පහත සඳහන් කර ඇත.

අනු අංකය	දායකයාගේ නම	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිලාභියාගේ නම	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
01	ඩබ්.එම්.වත්සලා මිය	01	එම්.ජී වයලට්	තඹුත්තේගම
02	ගිණුම	01	ඩබ්.ජී.ගුණවතී	කුණ්ඩසාලය
03		01	ටී.ඩබ්.ජී.අංගෝ	මාවනැල්ල
04		01	බී.ඩී ජේන් නෝනා	රිදීගම
05		01	ඩී.එම් ඩිංගිරි අම්මා	මාස්පොත
06		02	ඉදුරගේ නන්දතිලක	මිනුවන්ගොඩ
07			එම්.කේ.ඒ සෝමා ගුණවර්ධන	මිනුවන්ගොඩ
08		01	එම්.නෝබට් විමලරත්න	කැස්බෑව
09		01	අයි.ඇන්සි නෝනා	කැළණිය
10		01	ඊ.පියසිලි	කඩුවෙල
11		03	ඊ.හේමපාල පෙරේරා	මහරගම
12			ලීලාවතී වීරසිංහ	මහරගම
13			එම්.ඒ.හේමලතා පෙරේරා	මහරගම
14		01	එච්.එම්.හේරත් මැණිකේ	ඉබ්බාගමුව
15		01	ඒ.ජී.ධර්මවර්ධන	දැරණියගල
16		01	ජේ.පී.ලැයිසා	වරකාපොල
17		03	වර්ණපුලිගේ නන්දදාස	සීතාවක
18			පස්වැන්නගේ ප්‍රිතිලතා	සීතාවක
19			එච්.කුසුම් පෙරේරා	සීතාවක
20		01	ඊ.ජී ඩිංගිරි බණ්ඩා	දෙල්තොට

කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු - 2020

මාසය	කාමර වෙන් කළ ප්‍රමාණය	ආදායම රු.	වියදම්	
			ජල බිල්පත් රු.	විදුලි බිල්පත් රු.
ජනවාරි	03 (1 DAY)	4,500.00	2,966.70	7,275.60
පෙබරවාරි	13 (1 DAY)	19,500.00	4,815.00	9,549.72
මාර්තු	07 (17 DAY)	178,500.00	6,352.00	-
අප්‍රේල්	-	-	1,338.00	1,771.20
මැයි	-	-	-	7,479.00
පුනි	-	-	3,003.30	12,031.20
පුලි	08 (1 DAY)	12,000.00	3,954.90	7,829.94
අගෝස්තු	04 (1 DAY)	6,000.00	2,381.10	9,547.20
සැප්තැම්බර්	-	-	5,931.30	-
ඔක්තෝබර්	-	-	1,960.20	7,358.40
නොවැම්බර්	-	-	660.90	4,023
දෙසැම්බර්	-	-	532.80	3,862.80
එකතුව	**35**	**220,500.00**	**33,896.20**	**70,728.06**

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය.

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් පිහිටුවා ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සභාපති සහ සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ.වර්තමානයේ මෙහි සභාපති වනුයේ විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයෙකි.

මෙහි කාර්යභාරය වන්නේ දරුවන් විසින් නොසලකා හැර ඇති,වයස අවුරුදු 60 ඉක්මවූ,වියපත් දෙමාපියන්ට එම නොසලකා හැර ඇති දරුවන්ගෙන් ජීවත්වීම සඳහා යම් නඩත්තු මුදලක් ලබා දීමය.ඒ අනුව මෙම දරුවන් විසින් නොසලකා හැර ඇති දෙමාපියන්ගෙන් මණ්ඩලය වෙත පැමිණිල්ලක් ලැබුණු අවස්ථාවකදී,මණ්ඩලය විසින් වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුකූලව අදාල පැමිණිලිකරු හා වගඋත්තරකරු යන අය කැඳවා කරුණු විමසා පරීක්ෂණයක් සිදු කොට දෙමාපියන්ගේ මාසික යැපීමට ප්‍රමාණවත් වන නඩත්තු මුදලක් නියම කිරීම සිදු කරනු ලබයි.එලෙස තීරණය කිරීමේදී දරුවන්ගේ මෙන්ම දෙමාපියන්ගේද ආදායම්,යැපීම් අවශ්‍යතා ආදි සියලු සාධක සැලකිල්ලට ගැනීම සිදු කරනු ලබයි.

මෙහිදී දෙමාපියන් තම දරුවන්ගෙන් මෙන්ම තමන් විසින් දරුකමට හදා ගන්නා ලද දරුවන්ගෙන්ද (Adoped child) නඩත්තු ඉල්ලීමට හැකියාවක් ඇත.තවද යම් දෙමාපියෙකුගේ වයස අවුරුදු 60 නොඉක්මවනු ලැබුවද ඔහු/ඇය තම එදිනෙදා නඩත්තු සපයා ගැනීමට නොහැකි නිසා ශාරීරික හෝ මානසික ආබාධයකින් පෙලෙන්නේ නම් මෙම පනතේ 24(1) වගන්තිය යටතේ නඩත්තු ඉල්ලා සිටීමේ හැකියාව පවතී.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන ඉල්ලුම්පත් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීමේ පහසුකම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් සපයා ඇත.

නමුත්,මෙම මණ්ඩලයට පවුල් ආරවුල් මෙන්ම ඉඩකඩම් හෝ දේපල සම්බන්ධයෙන් පවුල් අතර පවත්නා ගැටලු විසඳීමට පනත යටතේ නෛතික බලයක් නැත.

මෙම නඩත්තු මණ්ඩලය විසින් ලබා දෙන යම් නඩත්තු ගෙවීමක් පිළිබඳ නියෝගයක් යම් දරුවකු විසින් පැහැරහරින අවස්ථාවකදී පනතේ 32 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයට එම තීරණය බලාත්මක කරවීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට යොමු කිරීමේ හැකියාව පවතී.එහිදී මහේස්ත්‍රාත් වරයෙකුට එම නියෝග නඩත්තු ආඥාපනත යටතේ කරන ලද අඥාවක් ක්‍රියාවේ යොදවන ආකාරයටම ක්‍රියාත්මක කිරීමේ බලය ඇත.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය - 2020

2020 වර්ෂයේ ලැබී ඇති පැමිණිලි	- 78
විසඳුම් ලබා දුන් පැමිණිලි ගණන	- 22
දැනට විභාගවෙමින් පවතින පැමිණිලි	- 48
පැවැත් වූ රැස්වීම් වාර ගණන	- 24
වියදම් වූ මුදල රු.	– 1,239,985 /-

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලයේ සාමාජිකයින්

ඩඩ්ලි අබේසිරි කරුණාරත්න මහතා	සභාපති
එම්.ජී.පුංචි බණ්ඩා මහතා	ලේකම්

මණ්ඩලයේ සාමාජික

1. ආචාර්ය ලීල් ගුණසේකර මයා
2. විශේෂඥ වෛද්‍ය හිලරි කුරේ මහතා
3. ගීතා ද ෆොන්සේකා මිය
4. රම්‍යා සුරියආරච්චි මිය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ - WDV	02	98,191,550.40	101,886,935.08
ජංගම වත්කම්			
ආයෝජන	03	2,019,776,871.21	1,708,227,066.89
කාර්ය මණ්ඩල ණය	04	6,933,113.00	6,526,199.00
කාර්ය මණ්ඩල අත්තිකාරම්	05	45,950.00	80,362.76
තොගය	06	883,334.76	618,843.95
වෙනත් ලැබිය යුතු දෑ	07	43,070,116.52	40,371,631.46
මුදල් සහ මුදල් හා සමාන දෑ	08	406,082,997.50	201,178,630.79
මුළු ජංගම වත්කම්		**2,476,792,382.99**	**1,957,002,734.85**
මුළු වත්කම්		**2,574,983,933.39**	**2,058,889,669.93**
හිමිකම්			
රාජ්‍ය ආයතන විසින් දායක ප්‍රාග්ධනය	09	38,236,465.22	46,311,747.80
ප්‍රාග්ධන පරිත්‍යාග	10	80,261,400.00	82,254,800.00
නැවත තක්සේරු කිරීමේ සංචිතය	11	324,615.28	(6,701,884.72)
සමුච්චිත අතිරික්තය/(හිඟය)	12	(35,186,151.44)	(26,262,035.37)
සම්පූර්ණ හිමිකම		**83,636,329.06**	**95,602,627.71**
වගකීම්			
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික)	13	29,141,217.50	23,568,970.50
කාර්ය මණ්ඩල ණය අරමුදල	14	1,951,624.58	1,398,017.85
වැඩිහිටි ආරක්ෂක අරමුදල	15	2,446,938,177.47	1,931,745,249.19
වැඩිහිටි ආවරණ කපකරු අරමුදල	16	26,984.35	70,984.35
මුළු ජංගම නොවන වගකීම්		**2,478,058,003.90**	**1,956,783,221.89**
ජංගම වගකීම්			
උපචිත වියදම්	17	9,165,308.20	1,000,909.57
සාමාන්‍ය තැන්පතු	18	3,572,292.23	1,870,431.91
ප්‍රතිපාදන සහ අනෙකුත් ගෙවීම්	19	552,000.00	1,017,400.00
පසුගිය වසරේ අධිභාරය		-	2,615,078.85
මුළු ජංගම වගකීම්		**13,289,600.43**	**6,503,820.33**
සම්පූර්ණ හිමිකම සහ වගකීම්		**2,574,983,933.39**	**2,058,889,669.93**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

පිටු 28 සිට 31 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 31 සිට 42 දක්වා පිටු වල සටහන් මෙම මුල්‍ය ප්‍රකාශනයට එකතු කළ කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා සභා සාමාජිකයන් වගකිව යුතුය

වෛද්‍ය එස්.එච්.මුණසිංහ මහතා
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

චන්දන රණවීර ආරච්චි
සමාජ සේවා අධ්‍යක්ෂ
(වැ.බ) ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2020 රු.	2019 රු.
ආදායම			
ශ්‍රී ලංකා රජයෙන් ප්‍රදාන	20	159,695,000.00	138,761,556.00
වෙනත් ආදායම්	21	424,049.18	355,449.33
විලම්භීත ආදායම	22	10,068,682.58	11,004,480.84
මුළු ආදායම		**170,187,731.76**	**150,121,486.17**
අඩු: වියදම්			
වැඩිහිටියන්ට ප්‍රතිලාභ වැඩසටහන්	23	33,694,827.10	52,034,708.32
සේවක පිරිවැය	24	115,411,313.50	76,112,226.98
දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය වීම	25	10,721,884.68	11,657,682.94
ගමන් වියදම්	26	2,868,681.00	3,069,978.08
සැපයුම්	27	2,074,562.57	2,412,779.53
නඩත්තු වියදම්	28	5,096,336.23	2,733,385.96
කොන්ත්‍රාත් සේවා	29	11,721,032.85	3,866,157.41
පුහුණුව සහ ධාරිතා ගොඩනැගීම		473,395.00	1,096,466.44
මුළු වියදම්		**182,062,032.93**	**152,983,385.66**
වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය).		**(11,874,301.17)**	**(2,861,899.49)**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

විස්තරය	ප්‍රග්ධනය දායකය		ප්‍රාග්ධන පරිත්‍යාග	නැවත තක්සේරු කිරීමේ සංචිත	සමුච්චිත අතිරික්තය
	ප්‍රාග්ධන අග්‍රිමය	ප්‍රග්ධන ප්‍රදාන			
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**40,778,420.08**	**11,590,875.00**	**84,248,200.00**	**(4,892,549.83)**	**(17,007,024.88)**
පෙර වර්ෂ ගැලපීම	-	-	-	(3,439,772.89)	(6,393,111.00)
වර්ෂය තුළ ගැලපීම	(3,642,422.28)	(2,415,125.00)	(1,993,400.00)	1,630,438.00	-
වර්ෂය සඳහා අතිරික්ත/හිහය	-	-	-	-	(2,861,899.49)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**37,135,997.80**	**9,175,750.00**	**82,254,800.00**	**(6,701,884.72)**	**(26,262,035.37)**
පෙර වර්ෂ ගැලපීම	-	-	-	-	(427,500.00)
වර්ෂය තුළ ගැලපීම	(5,110,157.58)	(2,965,125.00)	(1,993,400.00)	7,026,500.00	3,377,685.10
වර්ෂය සඳහා අතිරික්ත/හිහය	-	-	-	-	(11,874,301.17)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**32,025,840.22**	**6,210,625.00**	**80,261,400.00**	**324,615.28**	**(35,186,151.44)**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය

	2020 රු.	2019 රු.
අතිරික්තය / (හිඟය) බදු ගෙවීමට පෙර	**(11,874,301.17)**	**(2,861,899.49)**
ගැලපීම්		
විලම්භිත ආදායම	(10,068,682.58)	(11,004,480.84)
දේපල පිරියත හා උපකරණ මත ක්ෂය වීම	10,721,884.68	11,657,682.94
ප්‍රතිපාදන / (ආපසු) පාරිතෝෂිකය	5,886,467.00	4,857,921.00
නැවත තක්සේරු කිරීමේ සංචිතය	-	1,630,438.00
පෙර වර්ෂ ගැලපුම් ගිණුම	(427,500.00)	(9,832,884.39)
වර්ෂය තුළ ගැලපීම (පසුගිය වසරේ ලැබීම්)	3,377,685.10	-
ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම) කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර	**(2,384,446.97)**	**(5,553,222.78)**
ආයෝජන අඩුවීම(වැඩිවීම)/ (ස්ථාවර තැන්පතු)	(311,549,804.32)	(223,628,023.50)
තොග අඩුවීම /වැඩිවීම)	(264,490.81)	163,083.39
කාර්ය මණ්ඩල ණය (වැඩිවීම)/අඩුවීම	(406,914.00)	(76,412.00)
කාර්ය මණ්ඩල අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම	34,412.76	194,097.24
අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම	(2,698,485.06)	(33,551,020.46)
ප්‍රතිපාදන සහ අනෙකුත් ගෙවිය යුතු දේවල වැඩි වීම/(අඩුවීම).	(465,400.00)	(42,090.00)
කාර්ය මණ්ඩල ණය අරමුදලේ වැඩි වීම /(අඩු වීම).	553,606.73	261,690.22
සාමාන්‍ය තැන්පතු වැඩි වීම /(අඩුවීම).	1,701,860.32	62,500.00
උපචිත වියදම් වැඩි වීම /(අඩු වීම).	8,164,398.63	(288,333.46)
පසුගිය වසරේ අධිභාරය වැඩි වීම /(අඩුවීම).	(2,615,078.85)	222,570.85
මෙහෙයුම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම)	**(309,930,341.57)**	**(262,235,160.50)**
පාරිතෝෂික ගෙවීම්	(314,220.00)	(413,876.00)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම).	**(310,244,561.57)**	**(262,649,036.50)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	-	(4,248,249.71)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම).	**-**	**(4,248,249.71)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
රජයේ ප්‍රදානය (ප්‍රාග්ධනය)	-	2,953,533.56
වැඩිහිටි ආවරණ අනුග්‍රාහක යෝජනා ක්‍රමය	(44,000.00)	(59,000.00)
වැඩිහිටි ආරක්ෂක අරමුදල	515,192,928.28	411,312,307.74
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම)	**515,148,928.28**	**414,206,841.30**
ශුද්ධ (අඩු වීම)/ මුදල් සහ මුදල් සමාන දෑ වැඩි වීම	204,904,366.71	147,309,555.09
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් හා සමාන දෑ	201,178,630.79	53,869,075.70
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	**406,082,997.50**	**201,178,630.79**
මුදල් සහ මුදල් සමාන දෑ සැසඳීම		
මුදල් සහ මුදල් සමාන දෑ	**406,082,997.50**	**201,178,630.79**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. පිහිටුවීම හා නීතිමය තත්ත්වය

2011 අංක 05 දරන පනත මගින් සංශෝධිත 2000 අංක 09 දරන වැඩිහිටි අයිතිවාසිකම් සුරැකීමේ පනත යටතේ ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය පිහිටුවන ලද අතර එය විධිමත් ලෙස නීත්‍යානුකූල ආයතනයක් ලෙස පිහිටුවන ලදී. වැඩිහිටියන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය (NSE) ප්‍රධාන කාර්යාලය සහ ප්‍රධාන සේවා ස්ථානය ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල, සෙත්සිරිපාය II අදියර, 2 වන මහලෙහි වයින් ඩී හි පිහිටා ඇත.

1.1. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

වැඩිහිටියන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 60 ට වැඩි වැඩිහිටි පුද්ගලයින්ගේ සුභ සාධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ හා ජාතික මට්ටමේ පරිපාලන රාජ්‍ය ආයතනය වේ.

1.2 පිළියෙල කිරීමේ පදනම

1.2.1 අනුකූලතා ප්‍රකාශනය

ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, හිමිකම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICASL) සහ මුදල් අමාත්‍යාංශය එක්ව ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය අංශයේ ආයතන සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (SLPSAS) සහ 2000 අංක 09 දරණ වැඩිහිටි අයිතිවාසිකම් සුරැකීමේ පනතේ IV වැනි වගන්තියේ දක්වා ඇති අවශ්‍යතා අනුව මෙම ප්‍රකාශන සකස් කර ඇත.

1.2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන විශේෂයෙන් සඳහන් කර නොමැති නම් ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

1.2.3 අඛණ්ඩ පැවැත්ම

1.2.4 නුදුරු අනාගතයේ දී එහි මෙහෙයුම් කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ලේකම් කාර්යාලය සතුව ඇති බව කවුන්සිලයේ සාමාජිකයින් සෑහීමකට පත්වේ. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙනය.

1.3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

විශේෂයෙන් සඳහන් නොකළහොත් ඉදිරිපත් කරන ලද සියලුම වර්ෂ සඳහා ප්‍රතිපත්ති අඛණ්ඩව යෙදී ඇත.

(අ) විදේශ මුදල් ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය. විදේශ මුදල් ගණුදෙණුව පළමුව සටහන් වන්නේ ගණුදෙනුව සිදු වූ දිනයේ පවතින ක්‍රියාකාරී මුදල් අනුපාතිකයටය.

(ආ) දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය හා හානිකරණ පාඩු අඩුකර ප්‍රකාශ කර ඇත.

පසුකාලීන වියදම්

ප්‍රධාන පරීක්ෂණ සහ ප්‍රතිසංස්කරණ වියදම් ඇතුළුව වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරන ලද දේපල, පිරියත සහ උපකරණ අයිතමයක සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරණ ලද වියදම් ප්‍රාග්ධනීකරණය කර ඇත. අනෙකුත් පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය දේපල, පිරියත සහ උපකරණ අයිතමයේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අනෙකුත් සියලුම වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ දරන ලද වියදම් ලෙස හඳුනාගෙන ඇත.

වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය මත පදනම්ව, වාර්ෂිකව පහත සඳහන් අනුපාත භාවිතා කරමින් සරල මාර්ග ක්‍රමය මත ක්ෂයවීම් ගණනය කෙරේ. මිලදී ගත් වර්ෂය සඳහා තවදුරටත් ක්ෂයවීම් සම්පූර්ණයෙන්ම ගණනය කරන ලද අතර ඉවත් කිරීමේදී ක්ෂයවීම ගණනය කරනු නොලැබේ.

ගොඩනැගිලි	4%
මෝටර් වාහන	10%
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	15%
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	20%

වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පිළිබඳ අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් වන්නේ නම්, එවැනි වෙනස්කම් පිළිබිඹු කිරීමට එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භයේදී වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර වෙනස්කම් සිදු කරනු ලැබේ.

(ඇ) හානිකරණ

ධාරණ අගය ආපසු ලබා ගත නොහැකි බව පෙන්නුම් කරන සිදුවීම් හෝ තත්ත්වයන් වෙනස් වන විට දේපල, පිරියත සහ උපකරණවල ධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ. වත්කම්වල ධාරණ අගය එහි ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදලට වඩා වැඩි නම් වත්කම්වල ධාරණ අගය වහාම එහි ආපසු ලබාගත හැකි මුදලට ලියා හැර ඇත.

(ඈ) ආයෝජන

මෙම ආයෝජන ශ්‍රී ලංකාවේ රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු වලින් සමන්විත වේ. මෙම ස්ථාවර තැන්පතු පිරිවැයට ගිණුම්ගත කර ඇත. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට උපචිත පොළිය ලැබිය යුතු පොලී ලෙස දැක්වේ

(ඉ) තොග

තොගය, ලිපිද්‍රව්‍ය තොග සහ කාර්යාල අවශ්‍යතා වලින් සමන්විත වේ. ඒවා පිරිවැය ලෙස දක්වා ඇත .

(ඊ) ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ නැවත අයකර ගත හැකි අගයකින් ගෙන යනු ලැබේ. ණයගැතියන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ . අයකරගත නොහැකි බව දන්නා ණය ඒවා හඳුනාගත් වර්ෂය තුළ කපා හරිනු ලැබේ.

(උ) මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු වෙනුවෙන්, බැංකුවේ ඇති මුදල්, අතේ ඇති මුදල්, මාස තුනකට අඩු කල්පිරීමක් ඇති බැංකු වල ස්ථාවර තැන්පතු වලින් මුදල් සහ මුදල් සමාන ද්‍රව්‍ය සමන්විත වේ.

(ඌ) වගකීම් සහ වෙන්කිරීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මත ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත ගෙවීමට හෝ මූල්‍ය තත්ත්වය, ප්‍රකාශ කළ දින සිට වසරක් ඇතුළත ගෙවීමට නියමිත වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂයන් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හඳුනාගන්නා ලද සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත. අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ලේකම් කාර්යාලයට නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට වගකීම් සඳහා ප්‍රතිපාදන පිළිගනු ලබන අතර එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍ය වනු ඇත.

(එ) සේවක ප්‍රතිලාභ

අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම්

ලේකම් කාර්යාලයේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සාමාජිකයින් වන අතර ආයතනය එම සේවකයින්ගේ මූලික වැටුපෙන් හෝ වේතනයෙන් පිළිවෙලින් 12% සහ 3% දායක වේ.

(ඒ) ආදායම් හඳුනා ගැනීම

i. ශ්‍රී ලංකා රජයේ දායකත්වය

ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන දායකත්වය උපචිත පදනමක් මත පිළිගැනේ. එය ලේකම් කාර්යාලයේ වියදම් පියවීමේ පදනම මත පුනරාවර්තන සහ ප්‍රාග්ධන දීමනා ලෙස වෙන් කර ඇත.

ii. **පොලී ආදායම**

පොලී ආදායම උපචිත පදනම මත ගණනය කෙරේ.

(ඔ) ප්‍රාග්ධන වියදම් හඳුනා ගැනීම

සේවා පවත්වාගෙන යාම සඳහා හෝ ආයතනයේ ඉපැයීම් ධාරිතාව වැඩි කිරීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

02 දේපල, පිරියත සහ උපකරණ

පිරිවැය - 2020				
විස්තරය	**ආරම්භක ශේෂ**	**එකතු කිරීම්**	**බැහැර කිරීම/ලියා හැරීම**	**අවසාන ශේෂය**
ඉඩම්	38,400,000.00	-	-	38,400,000.00
ගොඩනැගිලි	50,880,552.92	-	-	50,880,552.92
වාහන	25,951,250.00	5,500,000.00	(1,800,000.00)	29,651,250.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	19,756,328.10	74,000.00	(5,101,411.02)	14,728,917.08
පිරියත සහ යන්ත්‍රෝපකරණ	22,356,523.80	1,452,500.00	(5,075,800.55)	18,733,223.25
	157,344,654.82	**7,026,500.00**	**11,977,211.57**	**152,393,943.25**

ක්ෂය වීම - 2020				
විස්තරය	**ආරම්භක ශේෂ**	**ක්ෂය වියදම**	**බැහැර කිරීම**	**අවසාන ශේෂය**
ගොඩනැගිලි	5,890,917.98	2,035,222.12	-	7,926,140.10
වාහන	17,043,750.00	2,965,125.00	(1,800,000.00)	18,208,875.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	15,628,398.46	1,974,892.91	(5,101,411.02)	12,501,880.35
පිරියත සහ යන්ත්‍රෝපකරණ	16,894,653.30	3,746,644.65	(5,075,800.55)	15,565,497.40
	55,457,719.74	**10,721,884.68**	**11,977,211.57**	**54,202,392.85**

පිරිවැය - 2019				
විස්තරය	**ආරම්භක ශේෂ**	**එකතු කිරීම්**	**බැහැර කිරීම/ලියා හැරීම**	**අවසාන ශේෂය**
ඉඩම්	38,400,000.00	-	-	38,400,000.00
ගොඩනැගිලි	50,880,552.92	-	-	50,880,552.92
වාහනය	25,951,250.00	-	-	25,951,250.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	19,142,215.89	614,112.21	-	19,756,328.10
පිරියත සහ යන්ත්‍රෝපකරණ	18,722,386.30	3,634,137.50	-	22,356,523.80
	153,096,405.11	**4,248,249.71**	**-**	**157,344,654.82**

ක්ෂය වීම - 2019				
විස්තරය	**ආරම්භක ශේෂ**	**ක්ෂය වියදම**	**බැහැර කිරීම**	**අවසාන ශේෂය**
ගොඩනැගිලි	3,855,695.86	2,035,222.12	-	5,890,917.98
වාහන	14,628,625.00	2,415,125.00	-	17,043,750.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	12,920,019.80	2,708,378.66	-	15,628,398.46
පිරියත සහ යන්ත්‍රෝපකරණ	12,395,696.14	4,498,957.16	-	16,894,653.30
	43,800,036.80	**11,657,682.94**	**-**	**55,457,719.74**

03 ආයෝජන

බැංකුව	ගිණුම් අංකය	2020	2019
ලංකා බැංකුව	83184804	9,734,533.42	8,877,597.00
ලංකා බැංකුව	84267474	-	441,265,085.79
ලංකා බැංකුව	84548377	-	658,990,294.33
ලංකා බැංකුව	84610903	-	296,928,484.28
ලංකා බැංකුව	85956728	720,405,155.97	-
ලංකා බැංකුව	86015670	324,525,706.62	-
ලංකා බැංකුව	86597211	480,841,235.56	-
මහජන බැංකුව	2086001000246661	54,264,743.79	-
මහජන බැංකුව	2086001000228120	-	71,997,543.59
මහජන බැංකුව	2086001000223030	-	49,767,688.35
මහජන බැංකුව	2086001000252993	77,617,164.01	-
මහජන බැංකුව	2086001000260350	77,567,359.71	-
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	200801575970	-	109,205,966.55
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	200801563670	-	71,194,407.00
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	200801606344	156,375,000.00	-
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	200801608614	118,445,972.13	-
එකතුව		**2,019,776,871.21**	**1,708,227,066.89**

04 සේවක ණය

	2020	2019
ආරම්භක ශේෂය	**6,526,199.00**	6,449,787.00
වර්ෂය තුළ ණය නිකුත් කළ	2,100,000.00	2,430,000.00
අඩු: වර්ෂය තුළ ලැබුණු වාරික	(1,693,086.00)	(2,353,588.00)
එකතුව (උපලේඛන අංක 01 බලන්න)	**6,933,113.00**	**6,526,199.00**

05 සේවක අත්තිකාරම්

	2020	2019
උත්සව අත්තිකාරම්	38,750.00	17,500.00
විශේෂ අත්තිකාරම්	7,200.00	-
ගංවතුර අත්තිකාරම්	-	62,862.76
එකතුව (උපලේඛන අංක 02 බලන්න)	**45,950.00**	**80,362.76**

06 තොග (උපලේඛන අංක 03 බලන්න)

07 වෙනත් ලැබිය යුතු දෑ

	2020	**2019**
ලැබිය යුතු පොලී	43,070,116.52	39,944,131.46
නිරවුල් නොකළ අත්තිකාරම්	-	427,500.00
එකතුව	**43,070,116.52**	**40,371,631.46**

08 මුදල් සහ මුදල් හා සමාන දෑ

	2020	**2019**
මුදල් ශේෂය A/C No 5234881	12,169,372.50	8,153,144.90
මුදල් ශේෂය A/C No 9179076	146,692.72	321,519.71
මුදල් ශේෂය A/C No 228075	393,766,932.28	192,703,966.18
එකතුව	**406,082,997.50**	**201,178,630.79**

09 රාජ්‍ය ආයතන විසින් දායක වන ප්‍රාග්ධනය

	2020	**2019**
ආරම්භක ශේෂය	**82,330,745.29**	**79,377,211.73**
භාණ්ඩාගාර ප්‍රදාන ප්‍රාග්ධනය - 2019	-	2,953,533.56
භාණ්ඩාගාර ප්‍රදාන ප්‍රාග්ධනය - 2020	-	-
	82,330,745.29	**82,330,745.29**
අඩු: විලම්භිත ආදායම - 2016	(9,630,951.51)	(9,630,951.51)
අඩු: විලම්භිත ආදායම - 2017	(8,056,724.59)	(8,056,724.59)
අඩු: විලම්භිත ආදායම - 2018	(9,320,240.55)	(9,320,240.55)
අඩු: විලම්භිත ආදායම - 2019	(9,011,080.84)	(9,011,080.84)
අඩු: විලම්භිත ආදායම - 2020	(8,075,282.58)	-
අවසාන ශේෂය	**38,236,465.22**	**46,311,747.80**

10. ප්‍රාග්ධන පරිත්‍යාග

	2020	2019
මල්වතු හිරිපිටිය ඉඩම	4,200,000.00	4,200,000.00
මාරගහලන්ද ඉඩම	13,000,000.00	13,000,000.00
කතරගම ඉඩම	18,000,000.00	18,000,000.00
කතරගම ඉඩම	3,200,000.00	3,200,000.00
මාලිගාතැන්න වැඩිහිටි නිවාසය	16,122,000.00	16,122,000.00
කතරගම වැඩිහිටි නිවාසය	33,713,000.00	33,713,000.00
	88,235,000.00	**88,235,000.00**
අඩු: විලම්භිත ආදායම		
2017 වසර සඳහා	(1,993,400.00)	(1,993,400.00)
2018 වසර සඳහා	(1,993,400.00)	(1,993,400.00)
2019 වසර සඳහා	(1,993,400.00)	(1,993,400.00)
2020 වසර සඳහා	(1,993,400.00)	-
එකතුව	**80,261,400.00**	**82,254,800.00**

11 ප්‍රත්‍යාගණන සංචිතය

	2020	2019
ආරම්භක ශේෂය	**(6,701,884.72)**	**(4,892,549.83)**
ප්‍රත්‍යාගණන අතිරික්තය/ ඌනතාවය	7,026,500.00	1,630,438.00
පෙර වර්ෂ ගැලපීම	-	(3,439,772.89)
අවසන් ශේෂය	**324,615.28**	**(6,701,884.72)**

12 සමුච්චිත අතිරික්තය/(ඌනතාවය)

	2020	2019
ආරම්භක ශේෂය	**(26,262,035.37)**	**(17,007,024.88)**
පෙර වර්ෂ ගැලපීම	(427,500.00)	(6,393,111.00)
වර්ෂය තුළ ගැලපීම	3,377,658.10	-
වර්ෂය සඳහා අතිරික්ත/ ඌනතාවය	(11,874,301.17)	(2,861,899.49)
අවසන් ශේෂය	**(35,186,178.44)**	**(26,262,035.37)**

13 සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික)

	2020	2019
ආරම්භක ශේෂය	**23,568,970.50**	19,124,925.50
අඩු: විශ්‍රාමික නිලධාරීන්ට ගෙවීම	(314,220.00)	(413,876.00)
වර්ෂය සඳහා ප්‍රතිපාදන	5,886,467.00	4,857,921.00
අවසන් ශේෂය (උපලේඛන අංක 04 බලන්න)	**29,141,217.50**	**23,568,970.50**

14 සේවක ණය අරමුදල

	2020	2019
ආරම්භක ශේෂය	**1,398,017.85**	1,136,327.63
ආපදා ණය සඳහා පොලී	553,606.73	261,690.22
අවසන් ශේෂය	**1,951,624.58**	**1,398,017.85**

15 වැඩිහිටි ආරක්ෂක අරමුදල

	2020	2019
ආරම්භක ශේෂය	**1,931,745,249.19**	**1,520,432,941.45**
DS කාර්යාලයෙන් ලැබීම්	477,200,000.00	502,813,900.00
FD වලින් පොලී ආදායම	164,129,962.18	205,724,788.21
	2,573,075,211.37	**2,228,971,629.66**
අඩු: වියදම් (උපලේඛන අංක 05 බලන්න)	(126,137,033.90)	(297,226,130.47)
බැංකු ගාස්තු	-	(250.00)
අවසන් ශේෂය	**2,446,938,177.47**	**1,931,745,249.19**

16 වැඩිහිටි ආවරණ කැපකරු අරමුදල

	2020	2019
ආරම්භක ශේෂය	**70,984.35**	**129,984.35**
මුළු ලැබීම්	47,000.00	59,000.00
	117,984.35	**188,984.35**
අඩු: ගෙවීම්	(91,000.00)	(118,000.00)
අවසන් ශේෂය	**26,984.35**	**70,984.35**

17 උපචිත වියදම්

	2020	2019
හඳුනා ගැනීම සඳහා වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම සහ වරප්‍රසාද සේවා සැපයීම	-	4,010.00
වැඩිහිටි නිවාස සඳහා ආධාර සැපයීම	-	2,080.00
වැඩිහිටි නිවාසවල වැඩිහිටියන් සඳහා වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා වැඩිහිටි නිවාස පරීක්ෂා කිරීම	-	14,984.68
වැඩිහිටියන් සඳහා පවත්වනු ලබන වැඩසටහන් අධීක්ෂණය සහ ඇගයීම	-	240,760.00
සේවක පිරිවැය	47,410.00	20,172.32
ගමන් වියදම්	361,911.00	394,927.00
සැපයුම්	4,110.00	91,878.00
නඩත්තු වියදම්	-	-
සේවාවන්	8,751,877.20	232,097.57
එකතුව	**9,165,308.20**	**1,000,909.57**

18 සාමාන්‍ය තැන්පතු

	2020	2019
ආරම්භක ශේෂය	**1,870,431.91**	**1,807,931.91**
මුළු ලැබීම්	3,878,353.26	5,172,634.55
	5,748,785.17	**6,980,566.46**
අඩු: ගෙවීම්	(2,176,492.94)	(5,110,134.55)
අවසන් ශේෂය	**3,572,292.23**	**1,870,431.91**

19 ප්‍රතිපාදන සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

විගණන ගාස්තුව	2020	2019
ආරම්භක ශේෂය	**1,017,400.00**	**1,059,490.00**
අඩු: ගෙවූ ගාස්තුව	(552,000.00)	(42,090.00)
වර්ෂය සඳහා ප්‍රතිපාදන	86,600.00	-
අවසන් ශේෂය	**552,000.00**	**1,017,400.00**

20 ශ්‍රී ලංකා රජයේ ප්‍රදාන

	2020	2019
පුනරාවර්තන	159,695,000.00	134,711,556.00
ප්‍රාග්ධන	-	4,050,000.00
එකතුව	**159,695,000.00**	**138,761,556.00**

21 වෙනත් ආදායම්

	2020	2019
ස්ථාවර තැන්පතු සඳහා පොලී	224,332.42	252,318.33
සංචාරක බංගලා ආදායම	145,335.00	93,793.00
විශේෂ අත්තිකාරම් සඳහා පොලී	2,671.76	1,658.00
කොඩි අලෙවියෙන් ලැබුණු ආදායම	-	7,680.00
ඉවතලන දෑ	51,710.00	-
එකතුව	**424,049.18**	**355,449.33**

22 විලම්භීත ආදායම

	2020	2019
ගොඩනැගිලි සඳහා ක්ෂය වීම	2,035,222.12	2,035,222.12
වාහන සඳහා ක්ෂය වීම	2,965,125.00	2,415,125.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ සඳහා ක්ෂය වීම	1,974,892.91	2,708,378.66
පිරියත සහ යන්ත්‍රෝපකරණ සඳහා ක්ෂය වීම	3,093,442.55	3,845,755.06
එකතුව	**10,068,682.58**	**11,004,480.84**

23 වැඩිහිටි ප්‍රතිලාභ වැඩසටහන්

	2020	2019
ග්‍රාමීය කමිටු පිහිටුවීම	928,473.00	1,794,322.70
* පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්	1,237,706.73	8,676,172.12
හඳුනා ගැනීම සඳහා වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම සහ වරප්‍රසාද සේවා සැපයීම	1,603,602.12	1,894,155.61
වැඩිහිටියන් සඳහා වෛද්‍ය ආධාර	5,317,222.00	999,635.80
වඩා හොඳ සේවාවක් සඳහා වැඩිහිටි නිවාස ප්‍රතිනිර්මාණය, ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණය සහ ලියාපදිංචි කිරීම	2,187,162.72	1,344,976.55
ස්වයං රැකියා ආධාර	11,829,575.00	10,946,693.10
ජ්‍යෙෂ්ඨ හරසර ක්‍රීඩා අනුග්‍රාහකත්ව වැඩසටහන	274,999.00	-
වැඩිහිටියන් සඳහා නීතිමය පහසුකම් සැපයීම	2,107,244.00	1,244,552.50
පරිපාලනය, අධීක්ෂණය සහ ඇගයීම	4,656,438.00	3,427,490.00
මාධ්‍ය සහ ප්‍රකාශන	1,183,129.97	2,089,054.88
ජාත්‍යන්තර වැඩිහිටි දිනය	2,316,974.56	12,352,525.89
වෙනත් වියදම්	52,300.00	428,366.98
වැඩිහිටි නිවාසවල වැඩිහිටියන් සඳහා වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා වැඩිහිටි නිවාස පරීක්ෂා කිරීම	-	480,560.59
වැඩිහිටියන් සඳහා පවත්වනු ලබන වැඩසටහන් අධීක්ෂණය සහ ඇගයීම	-	1,151,611.42
වැඩිහිටියන්ගේ සුභසාධනය සහ අයිතිවාසිකම් සහතික කිරීම සඳහා අංශ ඇති කිරීම	-	694,176.20
වැඩිහිටි නිවාස සඳහා ආධාර සැපයීම	-	4,357,723.98
විගණන කමිටු රැස්වීම	-	152,690.00
එකතුව	**33,694,827.10**	**52,034,708.32**

* "ආදරයයි කරුණාවයි" පොත් මුද්‍රණය සහ බෙදා හැරීමේ පිරිවැය රු. 1,162,528.00 ක් 2020 වර්ෂයේ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් වලට ඇතුළත් වේ.

24 සේවක පිරිවැය

	2020	2019
වැටුප් සහ වේතන	77,396,765.58	47,478,443.22
EPF දායකත්වය	7,547,505.30	6,844,815.77
ETF දායකත්වය	1,886,876.30	1,711,203.78
අතිකාල සහ නිවාඩු ගෙවීම්	947,160.14	870,889.01
වෙනත් දීමනා	21,746,539.18	14,336,583.78
දේපල ණය වාරිකය	-	12,370.42
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	5,886,467.00	4,857,921.00
එකතුව	**115,411,313.50**	**76,112,226.98**

25 දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය වීම

	2020	2019
ගොඩනැගිලි	2,035,222.12	2,035,222.12
වාහන	2,965,125.00	2,415,125.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	1,974,892.91	2,708,378.66
පිරියත සහ යන්ත්‍රෝපකරණ	3,746,644.65	4,498,957.16
එකතුව	**10,721,884.68**	**11,657,682.94**

26 ගමන් වියදම්

	2020	2019
දේශීය	2,868,681.00	3,034,293.98
විදේශීය	-	35,684.10
එකතුව	**2,868,681.00**	**3,069,978.08**

27 සැපයුම්

	2020	2019
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	755,380.45	1,369,555.46
ඉන්ධන	1,149,430.28	1,035,224.07
ආහාර සහ නිල ඇඳුම්	20,000.00	8,000.00
වෙනත්	149,751.84	-
එකතුව	**2,074,562.57**	**2,412,779.53**

28 නඩත්තු වියදම්

	2020	2019
වාහන	4,736,433.23	2,455,764.71
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	359,903.00	277,621.25
එකතුව	**5,096,336.23**	**2,733,385.96**

29 සේවා

	2020	2019
ප්‍රවාහන	279,499.00	333,097.00
තැපැල් හා විදුලි සංදේශ	1,048,434.44	1,390,480.27
විදුලිය සහ ජලය	1,372,197.26	1,706,423.52
කුලී	8,568,416.43	-
වෙනත්	365,885.72	436,156.62
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	86,600.00	-
එකතුව	**11,721,032.85**	**3,866,157.41**

30 කල්බදු බැඳීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට අනුව කල්බදු බැඳීම් නොමැත.

31 ප්‍රාග්ධන බැඳීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට අනුව ප්‍රාග්ධන බැඳීම් නොමැත.

32 සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට අනුව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නොමැත.

33 අවිනිශ්චිත බැරකම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට අනුව අවිනිශ්චිත බැරකම් නොමැත.

34 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පසු සිදුවන සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පසු සිදුවීම් කිසිවක් සිදු නොවීය.

35 සංසන්දනාත්මක සංඛ්‍යා

ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා අවශ්‍ය තැන්වල සංසන්දනාත්මක සංඛ්‍යා නැවත සඳහන් කර ඇත.

36 සභා සාමාජිකයින්ගේ වගකීම

SLPSAS වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සභා සාමාජිකයින්ගේ වගකීම වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එල්ඊඩබ්/සී/එන්එස්පීඩී/01/2020/05 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2021 ජූලි 30 දින

අධ්‍යක්ෂ,

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර ජාතික සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) වැඩිහිටි ආරක්ෂණ අරමුදලේ ස්ථාවර තැන්පතු පොලී ආදායම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුළත් කර තිබූ වටිනාකම රු. 164,129,962 ක් වුවද තැන්පතු සහතික අනුව විගණනය විසින් සිදු කරන ලද ගණනය කිරීම් අනුව එම වටිනාකම රු.150,185,456 ක් වූයෙන් වර්ෂය සඳහා වූ පොලී ආදායම රු.13,944,506 ක් වැඩියෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ සහ ලැබිය යුතු පොලි ලෙස දක්වා තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) බැංකු ගිණුමකට අදාල 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂය රු.192,703,966 ක් වුවත් 2020 ජනවාරි 01 දිනට මුදල් පොතේ ආරම්භක ශේෂය ලෙස වැරදීමකින් රු.192,814,950 ක් ලෙස ගෙන තිබීම නිසා ආරම්භක ශේෂයේ රු. 110,984 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම මෙම ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.393,833,916 ක් ක් වුවත් මූල්‍ය ප්‍රකාශ අනුව එම වටිනාකම රු. 393,766,932 ක් ලෙස දක්වා තිබීම නිසා මූල්‍ය ප්‍රකාශන හා මුදල් පොත අනුව ශේෂයේ රු.66,984ක වෙනසක් නිරීක්ෂණය විය.එසේ වුවත් එම වෙනස්කම් පිළිබඳව සොයා බලා මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සිදු කර නොතිබුණි .

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ජාතික සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ජාතික සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

ජාතික සභාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ජාතික සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ජාතික සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ජාතික සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ

ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2. 1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ජාතික සභාව පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ජාතික සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුවම අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව [illegible] බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව [illegible] සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් කරුණු

ස්වයං රැකියා ආධාර ලබාදීමේ වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.11,950,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මේ යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 141ක් ආවරණය වන පරිදි වැඩිහිටියන් 375 දෙනෙකුට ආධාර ලබාදී තිබුණි. එයින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 39ක පුද්ගලයන් 97 දෙනෙකු සඳහා ස්වයං රැකියා ආධාර වැඩසටහන යටතේ ලබාදුන් රු.2,605,000 ක් සම්බන්ධව අරමුදල් ලබාගත් බවට සනාථ කිරීමට අදාල ලියකියවිලි ඉදිරිපත් නොවීය. තවද ස්වයං රැකියා ආධාර ලබාදීමෙන් පසුව ත්‍රෛමාසික වාර්තා ඉදිරිපත් කළ යුතු වුව ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 94ක ස්වයංරැකියා ආධාර ලබාගත් පුද්ගලයින් 264 දෙනෙකු සම්බන්ධයෙන් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

ඩබ්ලිව්.ජී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

<u>වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහිත එහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන ලද විස්තරාත්මක විගණකාධිපති වාර්ථාව</u>

1.4.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	වර්ථමාන ප්‍රගතිය
සේවක ණය අරමුදල ලෙස ජංගම වගකීම් යටතේ මූල්‍ය භාවය ප්‍රකාශනයේ දක්වා ඇති ශේෂය රුපියල් 1,398,018 කි. ආපදා ණය වශයෙන් ගෙවන ලද මුදල් සඳහා ලැබෙන පොළිය එකතු වී මෙම ශේෂය ගොඩනැගී ඇත. මෙම අරමුදල ආරම්භ කළ ආකාරය සම්බන්ධ තොරතුරු නොමැති බැවින් මෙවැනි ශේෂයක් පවත්වා ගෙන යාමේ නීත්‍යානුකූල භාවය පිළිබඳ ගැටලුකාරී බව නිරීක්ෂණය විය	ආයතනයේ සේවයේ නියුතු නිලධාරීන්ට ආපදා ණය ගෙවීම සඳහා ණය මුදලක් ඇතිකරගෙන ඇත. ඒ අනුව එමගින් ණය ලබාදෙන අතර ණය ලාභීන්ගෙන් අයකරන වාරික මුදල් යොදාගෙන නැවත ණය ලබාදීම සිදුකරයි. ගිණුම් සකස් කිරීමේ දී එලෙස එකතු වන පොළිය වාර්ෂිකව සේවක ණය අරමුදල ලෙස වෙනමම ගිණුමකට බැර කර ඇත. නමුත් මෙවැනි අරමුදලක් භෞතිකව නොපවතින බව කාරුණිකව දැනුම් දෙමි. ඒ අනුව විගණනය විසින් ලබා දෙන නිර්දේශ පදනම් කරගෙන ඉදිරියේ දී ගිණුම් පොත් නිවැරදි කිරීමට කටයුතු කරමි.	ගිණුම් නිවැරදිව සකස් කර ඉදිරිපත් කළ යුතුය.	2020.12.31 දක්වා සේවක ණය අරමුදලට බැර කර තිබූ රු. 1,951,624.58 මුදල සමුච්චිත අතිරික්තයට එකතු කරන ලද අතර 2021 වර්ෂයේ සිට සේවක ණය සඳහා අයකරනු ලබන පොළිය වෙනත් ආදායම් යටතේ ගිණුම් ගත කිරීමට පියවර ගෙන ඇත. තවද, අදාල ගැලපීම් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් සිදු කර ඇත.

1.4.3 ගිණුම්කරණ අඩුපාඩු


	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	වර්ථමාන ප්‍රගතිය
(අ)	වැඩිහිටි ආරක්ෂණ අරමුදලේ ස්ථාවර තැන්පතු පොලී ආදායම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුළත් කර තිබූ වටිනාකම රු.164,129,962 ක් වුවද, තැන්පතු සහතික අනුව විගණනය විසින් සිදුකරන ලද ගණනය කිරීම් අනුව එම වටිනාකම රු.150,185,445 ක් වූයෙන් වර්ෂය සඳහා වූ පොලී ආදායම රු.13,944,506 ක් වශයෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ සහ ලැබිය යුතු පොළී ලෙස දක්වා තිබූ බව නිරීක්ෂණය විය	වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල යටතේ ඇති ස්ථාවර තැන්පතු වලින් වර්ෂය සඳහා ලැබෙන පොළී මුදල සඳහා ඉදිරියේ දී බැංකු මගින් තහවුරු කිරීමක් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ	වර්ෂයට අදාළ පොළී මුදල නිවැරදිව ගණනය කර දැක්විය යුතු වීම	වර්ෂය තුල කල් පිරීමේදී මුදලින් ලැබෙන පොළියට වර්ෂය අග උපචිත පොළිය ගලපා වර්ෂයේ පොළී ආදායම ගණනය කර ඇත. නමුත් සත්‍ය වශයෙන් කල්පිරීමේදී ලැබෙන පොළිය ඉහත ගණනය කරන පොළියට වඩා වෙනස් වේ. එයට හේතුව බැංකු විසින් පොළී ගණනය කිරීමේදී යොදා ගනු ලබන පදනමයි. විගණනයේ නිර්දේශ පරිදි වර්ෂයේ අවසාන දිනට තැන්පතුවල පොළී මුදල් ඉල්ලා සිටියද එසේ ලබා දිය නොහැකි බවට බැංකු විසින් දන්වන ලදි. ඒ අනුව වර්ෂය තුල මුදලින් ලද පොළියට තැන්පතු කාලය පදනම්ව ගණනය කරන ලද උපචිත පොළී එකතු කර වර්ෂයේ පොළී ආදායම ගිණුම් තුල ඇතුලත් කිරීමට කටයුතු කරන ලදි.

(ආ)	බැංකු ගිණුමකට අදාළ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂය රු.192,703,966 ක් වුවත් 2020 ජනවාරි 01 දිනට මුදල් පොතේ ආරම්භක ශේෂය ලෙස වැරදීමකින් රුපියල් 192,814,950ක් ලෙස ගෙන තිබීම නිසා ආරම්භක ශේෂයේ රු.110,984 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම මෙම ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.393,833,916 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.393,766,932 ක් ලෙස දක්වා තිබීම නිසා මූල්‍ය ප්‍රකාශන හා මූදල් පොත අනුව ශේෂය රු.66,984 ක වෙනසක් නිරීක්ෂණය විය එසේ වුවත් එම වෙනස්කම් පිළිබඳ සොයා බලා මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැළපීම් සිදු කර නොතිබුණි .	වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලට අදාළ මුදල් පොත සකස් කිරීමේදී සිදුවී ඇති ලිපිකාර දෝෂ හේතුවෙන් මෙම ශේෂයන් වෙනස් වී ඇති බව දන්වන අතර ඒවා නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.	මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ගිණුම් හා උප ලේඛන අතර සැසඳීම් සිදුකළ යුතු බව	පොතෙහි ශේෂයෙහි ඇතුලත් වූ රු. 26,984.35 ක් වූ වැඩිහිටි ආවරණ කැපකරු ශේෂය හා රු. 39,999.77 ක් වූ රු. 100/- අවකරන මුදල් ලැබීමක් මූල්‍ය ප්‍රකාශනවලින් මග හැරීම මෙම වෙනසට හේතු වී ඇත. අදාල අගයන් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කර ඇත. තවද, අදාල ගැලපීම් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් සිදු කර ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	වර්ථමාන ප්‍රගතිය
	ස්වයං රැකියා ආධාර ලබා දීමේ වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.11,950,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. මේ යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 141 ක් ආවරණය වන පරිදි වැඩිහිටියන් 375 දෙනෙකුට ආධාර ලබා දී තිබුණි. එයින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 39 ක පුද්ගලයන් 97 දෙනෙකු සඳහා ස්වයං රැකියා ආධාර වැඩසටහන යටතේ ලබා දුන් රු.2,605,000 ක් සම්බන්ධව අරමුදල් ලබා ගත් බවට සනාථ කිරීමට අදාළ ලියකියවිලි ඉදිරිපත් නොවීය. තවද ස්වයං රැකියා ආධාර ලබා දීමෙන් පසුව ත්‍රෛයිමාසික වාර්තා ඉදිරිපත් කළ යුතු වුව ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 94ක ස්වයං රැකියා ආධාර ලබා ගත් පුද්ගලයින් 264 දෙනෙකු සම්බන්ධයෙන් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	ස්වයං රැකියා ආධාර ලබා ලබාදීමේ වැඩසටහන් සම්බන්ධව මුදල් ලබාගත් බවට සනාථ කිරීම් කරන වාර්තා ගෙන්වා ගැනීමට 2021.04.28 දින සිහිකැඳවීම් ලිපියක් යොමුකර ඇති අතර ඒ අනුව තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 39 ක පුද්ගලයින් 97 දෙනෙකුගෙන් අදාළ වාර්තා ලැබිය යුතුය. එසේම මෙම වැඩසටහනට සම්බන්ධව ත්‍රෛයි මාසික වාර්තා ගෙන්වා ගැනීමට අදාළව 2021.04 .28 වන දින සිහි සිහිකැඳවීම් ලිපි යොමු කර ඇති අතර ඒ අනුව තවත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 94ක පුද්ගලයින් 264 දෙනෙකුගෙන් අදාළ වාර්තා ලැබිය යුතුය.	මුදල් වියදම් කිරීම සම්බන්ධව නිසි පරිදි තහවුරු කිරීම් ලබාගත යුතු වීම.	මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 114 කින් ප්‍රගතිය එවා ඇති අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 27 ක නිලධාරීන්ගේ ත්‍රෛයිමාසික වාර්ථා මේ වනතෙක් ලැබී නොමැති බැවින් එම නිලධාරින්ගේ 2021 වර්ෂයට අදාල වැටුප් වර්ධකය ලබා දීම පිළිබඳව අවධානය යොමු කරන බවද තවදුරටත් දන්වමි.



කේ.ජී.ලැනරෝල්
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය